tamilguru.lk



# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ සහකාර - තාක්ෂණ බණ්ඩ 03 සේවා ගණයේ තාක්‍ෂණ සහායක තනතුරේ III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025**

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්‍ෂණ සහායක III ශ්‍රේණියේ තනතුරේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා විවෘත පදනම මත සුදුසුකම්ලත් ස්ත්‍රී / පුරුෂ දෙපාර්ශ්වයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ. පුරප්පාඩු සංඛ්‍යාව 34කි. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2026.01.16 වේ.**

02. සේවා කොන්දේසි:

2.1 මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතුය.

2.2 මෙම තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබන අපේක්ෂකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ සහකාර - තාක්ෂණ බණ්ඩ 03 සේවා ගණයේ තාක්‍ෂණ සහායක තනතුරේ III ශ්‍රේණිය සඳහා පත් කරනු ඇත.

2.3 අදාළ පත්වීම රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මකවීම සම්බන්ධයෙන් නිකුත්කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අදාළ ආනුෂාංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධානවලට යටත් වේ.

2.4 සුදුසුකම් සම්පූර්ණ කරන ලද තෝරා ගනු ලබන අයදුම්කරුවන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මධ්‍යම පළාත තුළ පුරප්පාඩු පවතින ආයතන වෙත අනුයුක්ත කරනු ඇත.

2.5 සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්යය වේ.

2.6 මෙම තනතුරට පත් කිරීමෙන් අනතුරුව මධ්‍යම පළාත තුළ අවම වශයෙන් වසර 05ක සේවා කාලයක් අනිවාර්යයෙන් සම්පූර්ණ කළ යුතු අතර, එම කාලය තුළ දී මධ්‍යම පළාතෙන් පිටතට ස්ථාන මාරු ලබා ගැනීමට කරනු ලබන කිසිදු ඉල්ලීමක් සලකා බලනු නොලැබේ. තවද පත් කරනු ලබන සේවා ස්ථානයේ වැඩ භාරගත් දින සිට අවුරුදු 03ක අවම සේවා කාලයක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතුය.

03. වැටුප් පරිමාණය:

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි MT 1- 2025 අනුව මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්‍ෂණ සහායක III ශ්‍රේණියට හිමි වැටුප් පරිමාණය
**රු.50,090 -10 x 540 -11 x 630- 10 x 1010- 10 x 1190 - රු. 84,420/- වේ.**
පත්වීම ක්‍රියාත්මකවන දින සිට එම චක්‍රලේඛයේ උපලේඛන III හි සඳහන් පරිදි වැටුප් ගෙවනු ලැබේ.

04. සපුරාලිය යුතු සුදුසුකම් :

I. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. (ඒ අනුව ,2008.01.16 දිනට හෝ ඊට පෙර හා 1991.01.16 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

III. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

IV. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක පදිංචි අයදුම්කරුවෙකුට ඉල්ලුම් කළ හැකිය. අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට පූර්වාසන්නයෙන් වූ වසර 03 ක කාලය තුළ මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචිකරුවන් හා කලත්‍රයා මෙම පළාතේ පූර්වාසන්න වසර 03ක ස්ථිර පදිංචි අයෙකුවන

අයදුම්කරුවන් බඳවා ගැනීමෙන් පසුව ශ්‍රී ලංකාවේ අනෙකුත් පළාත්වල පදිංචි සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන්, ලබාගත් ලකුණුවල ප්‍රමුඛතාව මත මධ්‍යම පළාත් සභාව තුළ වසර 05ක් අනිවාර්යයෙන්ම සේවය කිරීමේ කොන්දේසියට යටත්ව බඳවා ගැනේ.

V. සෑම අයදුම්කරුවෙකුම මධ්‍යම පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

VI. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම තනතුරුවලට ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම් නොලබයි.

VII. පහත සඳහන් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

<u>අධ්‍යාපන සුදුසුකම්:</u>

භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය හා විද්‍යාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින්(06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම.

<u>වෘත්තීය සුදුසුකම්:</u>

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2012 ප්‍රකාරව අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම්වල 05 වන මට්ටමේ පාඨමාලා සහතිකය (NVQ) ලබා තිබීම හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ඒ හා සමාන යැයි පිළිගනු ලබන සුදුසුකම් ලබා තිබීම.

05. බඳවා ගැනීමේ ක්‍රමය :

I. මේ සඳහා මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත විභාගයේදී ලබා ගන්නා මුළු ලකුණු වල ප්‍රමුඛතාව මත සුදුසුකම් පරීක්‍ෂා කර බැලීමේ සම්මුඛ පරීක්‍ෂණයකින් අනතුරුව සුදුස්සන් තෝරා ගැනේ. (මෙම සම්මුඛ පරීක්‍ෂණයේ දී ලකුණු ලබා දීමක් සිදු නොවේ.) ලිඛිත විභාගයේදී එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා 40%ක අවම ලකුණු ප්‍රමාණයක් ලබා නොගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා සලකා බලනු නොලැබේ. විභාගයේ දී ලබා ගන්නා ලකුණු ප්‍රමුඛතාව පදනම් කරගනිමින් පවතින පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

II. ලකුණු ප්‍රමුඛතාවය අනුව පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ දී, කිසියම් අවස්ථාවක ඉතිරි වී ඇති පුරප්පාඩු සංඛ්‍යාවට වැඩි සංඛ්‍යාවක් සම ලකුණු ලබාගත් සුදුසුකම්ලත් අපේක්ෂකයන් සිටිනම් හා එම පුරප්පාඩු ද පිරවීමේ සේවා අවශ්‍යතාවයක් තත්කාලයේ පවතී නම්,එසේ සම ලකුණු ලබා ගත් අපේක්ෂකයන් අතුරින් වැඩිදුර තෝරා ගැනීමක් සිදු කිරීමට මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකිය. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2024 හි විධිවිධාන හා තෝරා ගැනීමේ පරිපාටිය ප්‍රකාරව සම ලකුණු ලබා ගත් අපේක්ෂකයින්ගේ හැකියාව ඇගයීම සඳහා වන ලිඛිත පරීක්ෂණයක් පමණක් පවත්වා අදාළ තෝරා ගැනීම් සිදුකරනු ලබයි.

III. මෙම තනතුරෙහි පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසන් තීරණය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

06. විභාගය පිළිබඳ විස්තර:

I. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. අයදුම්පත්‍රයේ තමන් විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයට නියමිත අංකය පැහැදිලිව සඳහන් කළයුතු අතර, එය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

II. අපේක්ෂකයා ඉදිරිපත් වන සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.

III. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීති වලට අයදුම්කරුවන් යටත් විය යුතුය.

IV. විභාග මධ්‍යස්ථානය - මෙම විභාගය මහනුවර දී පමණක් පවත්වනු ලැබේ.

V. විභාගය සඳහාවන විෂය නිර්දේශය:

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| තාක්ෂණික ප්‍රශ්න පත්‍රය | පැය 03 | 100 | 40 |

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයන් තීරණය කිරීමේ ශක්තියත්, විනිශ්වය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්තය. |
| තාක්ෂණික ප්‍රශ්න පත්‍රය | ගොඩනැගිලි ඉදිකිරීමේ මූලධර්ම, ඉදිකිරීම් කාර්ය සඳහා පිඹුරුපත් සකස් කිරීම හා කියවා වටහා ගැනීමේ හැකියාව, ඇස්තමේන්තු පිළියෙල කිරීමේ හැකියාව, ජල සැපයීම, ජල ප්‍රවාහන ක්‍රියාමාර්ග හා අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රියා පිළිවෙල පිළිබඳව අපේක්ෂකයා සතු අත්පත් කර ගත යුතු හැකියාවන් විනිශ්වය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්ත වේ. |

07. අයදුම් කළයුතු ක්‍රමය :

I. අයදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව A4 කඩදාසියේ දෙපසම භාවිත කර පිළියෙල කර අපේක්ෂකයා තම අත්අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය. අංක 01 සිට 03 තෙක් පළමු පිටුවටද, අංක 04 සිට 06 තෙක් දෙවන පිටුවටද, අංක 07 සිට 11 තෙක් තෙවන පිටුවටද, වන සේ සකස් කළ යුතුය. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් නැවත විමසා බැලිය යුතුය. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අයදුම්පත්‍ර, අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර සහ නිවේදනයේ සඳහන් පරිදි මූලික සුදුසුකම් නොමැති බව අයදුම්පත්‍රයේ තොරතුරු අනුව පෙනී යන්නේ නම් ද කිසිදු දැනුම්දීමකින් තොරව එම අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.

II. අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද සඳහන් කළ යුතුය.

III. සෑම අපේක්ෂකයෙකුම විභාග ගාස්තුවක් මධ්‍යම පළාත් සභාවට ගෙවිය යුතුය. විභාග ගාස්තුව රු.600/-කි. මෙම විභාග ගාස්තුව මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ **20-03-02-13** ට බැර වන පරිදි අයදුම්පත්‍ර භාරගනු ලබන අවසාන දිනට හෝ ඊට ප්‍රථම මධ්‍යම පළාත තුළ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා, ඒ සඳහා ලබාගත් **නිල් පැහැති** ලදුපතක් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (වෙනත් ශීර්ෂයකට ගෙවීම් කරන ලද කුවිතාන්සි හෝ මධ්‍යම රජයට අයත් කහ පැහැති කුවිතාන්සි අලවා ඇතොත් එම අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබේ.) එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. එකී ලදුපත නොමැතිව යොමු කරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, විභාගය සඳහා ගෙවන ලද විභාග ගාස්තුව කිසිදු හේතුවක් මත හෝ ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු නොකෙරේ. තවද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

**මධ්‍යම පළාතින් බැහැර පළාත් වල අයදුම්කරුවන් තම විභාග ගාස්තු ගෙවීමේදී පහත සඳහන් ක්‍රමවේදය අනුගමනය කළ හැකිය.**

- තම විභාග ගාස්තු දිවයිනේ පිහිටි ඕනෑම මහජන බැංකු ශාඛාවක් මගින් මහනුවර මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක 003-1-001-0-0006004 දරන ගිණුමට බැර කර ඒ සඳහා බැංකුවෙන් නිකුත් කරන අදාළ රිසිට්පත අයදුම්පත්‍රයට නොගැලවෙන සේ ඇලවිය යුතුය.

- බැංකු රිසිට් පත පිරවීමේ දී ගිණුම් හිමියාගේ නම "ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව" ලෙස සඳහන් කළ යුතු අතර, අයදුම්කරුගේ නම, ලිපිනය, දුරකථන අංකය , ජාතික හැඳුනුම්පත් අංකය හා හේතුව ලෙස

"මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ සහකාර - තාක්ෂණ බණ්ඩ 03 සේවා ගණයේ තාක්‍ෂණ සහායක තනතුරේ III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025" යනුවෙන් සඳහන් කර බැංකු රිසිට් පත පුරවා එවීම අනිවාර්යය වේ.

IV. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 ශ්‍රේණිගත කිරීමට අනුව තෘතීය හෝ ෂෂ්ඨ මට්ටමේ රජයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

V. අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුව නිවැරදිව සම්පූර්ණ කර **2026.01.16** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ **'ලේකම්,මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර'** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ **"මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ 03 සේවා ගණයෙහි තාක්ෂණ සහයක III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීම - 2025"**යනුවෙන් සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී අස්ථානගත වන අයදුම්පත් සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව වග කියනු නොලැබේ. අයදුම්කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසු ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

VI. අයදුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ.

VII. අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. විභාග නිවේදනයේ සඳහන් සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරනු ඇත. අපේක්ෂකයෙකු හට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විසින් මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා, නිවේදනයට අනුව අදාළ සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ දී අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව අනාවරණය වුවහොත් ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත.

VIII. විභාග මධ්‍යස්ථානය පිළිබඳව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශපත්‍රය මඟින් දැනුම් දෙනු ලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.cp.gov.lk මඟින් පළකරනු ඇත. ප්‍රවේශපත්‍ර විභාගය පැවැත්වීමට දින 14 කට පෙර අයදුම්කරු විසින් අයදුම්පතෙහි දක්වා ඇති ජංගම දුරකථනය අංකය වෙත කෙටි පණිවිඩයක් (SMS) මඟින් හෝ අයදුම්කරුවන්ගේ අයදුම්පතෙහි සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනයට විද්‍යුත් තැපෑල මඟින් හෝ යොමු කරනු ලැබේ.

IX. නිවේදනය පළ වී දින 04 ක් 05 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍ර නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ සහ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක්ද, අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සියද, අතැතිව ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම නිවැරදිව සඳහන් කරමින් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයෙන් විමසිය යුතුය. දුරකථන අංකය 081-2213097/විද්‍යුත් තැපෑල psc.cp.gov@gmail.com.

08. විභාගයට පෙනී සිටින සියලුම විභාග අපේක්ෂකයන් තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේ දී පමණක් විභාගයට පෙනී සිටිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනු ඇත.

09. **අපේක්ෂකයාගේ අනන්‍යතාවය.**

මෙම විභාගයට අයත් සෑම විෂය පරීක්ෂණයක දී ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් තම අනන්‍යතාව ඔප්පු කර සිටීමට අයදුම්කරුවන් ක්‍රියාකල යුතුය. මේ සඳහා පහත දැක්වෙන කවර හෝ එක ලියවිල්ලක් ප්‍රමාණවත් වේ.

- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත ;
- වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය ;
- වලංගු විදේශ ගමන් බලපත්‍රය.

විභාග අපේක්ෂකයන් සිය අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණ කිරීමෙන් තොරව විභාගයට පෙනී සිටිය යුතු අතර, විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ නොමැති බවට සනාථ කරන අයදුම්කරුවන් පමණක් විභාග ශාලාවට ඇතුළත් කර ගනු ලැබේ. එසේ තම අනන්‍යතාවය සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කරනු නොලැබේ. තවද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන්වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

10. **සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම :**

10.1. මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයෙකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවකදී වුවද ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

10.2. අපේක්ෂකයෙකු විසින් සපයන ලද තොරතුරු පසු කලෙකදී වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු / ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව අනාවරණය වුවහොත් හෝ ඔහු /ඇය වෙත තවදුරටත් පත්වීමක් ලබා දීම සම්බන්ධයෙන් සලකා බලනු නොලබන අතර, මෙම විභාගය හේතුකොටගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහකිරීමට වුවද යටත් වේ.

11. මෙම විභාගයේ ප්‍රතිඵල ලේඛනය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.cp.gov.lk මඟින් පළ කරනු ඇත.

12. මෙම නිවේදනයේ ආවරණය වන / නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද මෙම විභාගය පැවැත්වීම පිළිබඳව හෝ පැවැත්වීමෙන් පසුව තෝරා ගැනීම් කිරීම/නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව අවසාන තීරණය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එසේම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම / තීරණය කිරීම මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

13. මෙම බඳවා ගැනීමට අදාළ නිවේදනය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.cp.gov.lk හි පළකර ඇති අතර අදාළ අයදුම්පත්‍රයද එහිදී භාගත කරගැනීමට හැකි බවද කාරුණිකව දන්වමි.

14. මෙම නිවේදනයේ සිංහල , දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්වෙනු ඇත.

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

කේ. කේ. ජී. අයි. ඩී. පී. විජේතිලක,<br>
ලේකම්,<br>
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,<br>
මධ්‍යම පළාත් සභාව.

2025 දෙසැම්බර් මස 23 දින<br>
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,<br>
අංක 244, කටුගස්තොට පාර,<br>
මහනුවර.

ආදර්ශ අයදුම්පත්‍රය

**මධ්‍යම පළාත් සහා රාජ්‍ය සේවයේ තාක්‍ෂණ සහායක III ශ්‍රේණියේ තනතුරට**
**බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය - 2025**

**Open Competitive Examination for Recruitment to Post of Grade III Technical Assistant in Central Provincial Public Service – 2025**

විභාග අංකය :- ____________

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

(අදාළ සංකේතය කොටුව තුළ ලියන්න.)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :- ____

සිංහල - 1
දෙමළ - 2
ඉංග්‍රීසි - 3

පදිංචි දිස්ත්‍රික්කය :- ____________

01. 1.1 මුලකුරු සමඟ නම :- ..........................................................................
Mr./Mrs./Miss (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(උදා :- SILVA A.B.C.D.)

1.2 මුලකුරු සමඟ නම :-..........................................................................
මයා/මිය/මෙනවිය(සිංහලෙන්/දෙමළෙන්)

1.3 මුලකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :- ..........................................

1.4 මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන්/දෙමළෙන්):-..........................................

02. 2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :-..........................................

2.2 විද්‍යුත් තැපැල් ලිපිනය (e –mail Address) : ..........................................

2.3 ජාතික හැඳුනුම්පත් අංකය :- | | | | | | | | | | | | |

2.4 ස්ත්‍රී/පුරුෂ භාවය 0 -පුරුෂ , 1- ස්ත්‍රී ____ (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.5 විවාහක/අවිවාහක බව :- 1- අවිවාහක 2- විවාහක ____

03. 3.1 උපන් දිනය : | | | | | | | | |

3.2 අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට (2026.01.16) වයස :- අවු : ..........., මාස : ..............., දින : ..............

3.3 දුරකථන අංකය : ජංගම:- | | | | | | | | | | | ස්ථාවර:- | | | | | | | | | | |

(විභාග පිළිබඳව දැනුම්දීම සඳහා)

04. 4.1 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:-..............................................................................................

* (අයදුම්කරුගේ ස්ථිර පදිංචිය මධ්‍යම පළාතේ නොවී කලත්‍රයා මධ්‍යම පළාතේ පූර්වාසන්න වසර 03ක ස්ථිර පදිංචි අයෙකු නම් අයදුම්කරුවන් කලත්‍රයාගේ පදිංචිය සම්බන්ධ තොරතුරු ඇතුළත් කළ යුතුය.)

* කලත්‍රයා මධ්‍යම පළාතේ පූර්වාසන්න වසර 03 ක ස්ථිර පදිංචි අයෙකුනම් ✓ සලකුණ යොදන්න ☐

| *ඡන්ද හිමි නාම ලේඛනයට අනුව පදිංචිය* | *2022* | *2023* | *2024* |
|---|---|---|---|
| මැතිවරණ කොට්ඨාසය | | | |
| ඡන්ද ප්‍රදේශය | | | |
| ඡන්ද කොට්ඨාසය | | | |
| ග්‍රාම නිලධාරී කොට්ඨාස අංකය | | | |
| ගෘහ අංකය | | | |
| නමට ඉදිරියෙන් ඇති පිළිවෙල අංකය | | | |

05. ***අධ්‍යාපන සුදුසුකම්:-***

5.1 අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය:-

වර්ෂය: ................. විභාග අංකය: .......................

| *විෂයය* | *සාමාර්ථය* | |
|---|---|---|
| | *පළමු වර* | *දෙවන වර* |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

5.2. අ.පො.ස (උසස් පෙළ) විභාගය:- **(සමත්ව ඇත්නම්)**

වසර :-................ විභාග අංකය :-.....................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

06. වෘත්තීය (තාක්ෂණ) සුදුසුකම්:-

| *ආයතනය* | *හදාරා ඇති පාඨමාලාව* | *පාඨමාලාවේ වලංගු දිනය* | *NVQ මට්ටම* | *NVQ සහතිකපත් අංකය* | *සහතික පත්‍රය වලංගු දිනය* |
|---|---|---|---|---|---|
| | | | | | |

07. විභාග ගාස්තු රු: 600/- ගෙවීම පිළිබඳ තොරතුරු :

i. විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ/මහජන බැංකු ශාඛාවේ නම :-............................................................
ii. දිනය :- ...........................................................................................
iii. කුවිතාන්සි අංකය :- ..........................................................................

| |
|---|
| මුදල් ගෙවූ ලදුපත /රිසිට් පත නොගැලවෙන සේ මෙම කොටුව තුළ අලවන්න.<br><br>( ලදුපතේ /රිසිට් පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ) |

08. ඔබ කිසියම් වරදකට උසාවියෙන් දඬුවම් ලබා තිබේද ?............................................................
"ඔව්"නම් විස්තර දක්වන්න. :- ..................................................................................................

09. ***අයදුම්කරුගේ ප්‍රකාශය :-***

මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි සඳහන් කරුණු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සකු වන බවත්, පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහකිරීමට යටත් වන බවත් මා දනිමි. තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ප්‍රකාශ කරමි.

.................................. .............................................,
දිනය අයදුම්කරුගේ අත්සන.

10. ***අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :***

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................................................................... මහතා/මහත්මිය/මෙනෙවිය මම පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය අද දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත්, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත් එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

................................. .............................................,
දිනය සහතික කරන්නාගේ අත්සන.
(නිල මුද්‍රාව සහිතව)

සහතික කරන්නාගේ සම්පූර්ණ නම :- .........................................................................
තනතුර :- .........................................................................
ලිපිනය :- .........................................................................

11. ***අයදුම්කරු රජයේ / පළාත් රාජ්‍ය සේවාවේ නියුක්ත අයෙකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :-***

.........................................................................................මහතා/ මහත්මිය/ මෙනෙවියගේ අයදුම්පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ............................................................ වශයෙන් ස්ථිර / තාවකාලික/ අනියම් පදනමින් සේවය කරන බවත්, මෙම තනතුර සඳහා ඔහු / ඇය තෝරාගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් නිදහස් කළ හැකි බවත් සහතික කරමි.

.................................. .................................................................,
දිනය දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව සහිතව)

12-644

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.